## ප්‍රථමාධාර

### පානය කිරීමකදී

- කිසිවක් පානය කිරීමට නොදෙන්න
- වමනය කරවීමෙන් වළකින්න
- රෝගියාට සිහිය නැතිනම් හෝ මඳ සිහිය ඇතිනම් වම් ඇලයට හරවා නිකට මඳක් ඔසවා තබන්න.



- රෝගියා හැකි ඉක්මණින් ආසන්නම රෝහල වෙත රැගෙන යන්න.

### ඇස්වල තැවරුන විට

- ඇස් පිරිසිදු ගලන ජලයෙන් මිනිත්තු 15-20 පමණ සෝදන්න



- කිසිදු ඖෂධ වර්ගයක් හෝ තෙල් වර්ගයක් ඇසට නොදමන්න.

### සමෙහි තැවරුන විට

- විෂ ද්‍රව්‍ය තැවරුණු ඇඳුම් ඉක්මණින් ඉවත් කරන්න
- තැවරුන ස්ථානය සබන් හා පිරිසිදු ගලන ජලයෙන් මිනිත්තු 15-20 පමණ සෝදන්න



- සම මතු පිට රතු වීමක්, අධික වේදනාවක් හෝ තුවාල සිදු වී ඇත්නම් වහාම රෝහල වෙත රැගෙන යන්න.

### ආඝ්‍රානය වූ විට

- රෝගියා වහාම එම ස්ථානයෙන් ඉවත් කර පිරිසිදු වාතාශ්‍රය ලැබීමට සලස්වන්න.
- හුස්ම ගැනීමේ අපහසුතාවයක් ඇත්නම් වහාම රෝහල වෙත රැගෙන යන්න.
(රසායනික ද්‍රව්‍ය හෝ පළිබෝධනාශක අඩංගු ලේබලය සහිත බඳුන ඇත්නම් රෝහලට රැගෙන යන්න)

ආරක්ෂාව පිළිබඳ සැළකිලිමත් වීමෙන් ගෘහස්ථ විෂවීම් වළක්වා ගත හැක.

## විෂ වීමකදී

0112- 686-143
0112- 691- 111

ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල

npdic.nhs@gmail.com
infotoxlanka@gmail.com

http://www.toxbaselanka.info

https://www.facebook.com/ NTPICSL

https://twitter.com/ PoisonCenterSL

ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.
අනුග්‍රහය සෞඛ්‍ය අමාත්‍යාංශය මගිනි.

# ගෘහස්ථ විෂ වීම් වළක්වා ගනිමු




අප නිවසේ දෛනික අවශ්‍යතාවයන් ඉටු කිරීමේදී භාවිතා කරන විවිධ ද්‍රව්‍යයන්හි අඩංගු රසායනික සංඝටක නොසිතූ පරිදි ශරීරගත විය හැක. පසුගිය වසර කිහිපය තුල මෙම ගෘහස්ථ විෂ වීම් ඉහළයාමේ ප්‍රවණතාවයක් දැකිය හැක.

ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

# නිවසේ බහුලව දැකිය හැකි විෂ රසායනික ද්‍රව්‍ය හමුවන ස්ථාන

## නිදන කාමරය

- සුවඳ විලවුන් වර්ග,තොල් හා නිය ආලේපන, ආලේපන ඉවත් කරන ද්‍රව්‍ය, ක්‍රීම් වර්ග, කපුරු බෝල

- ඖෂධ, බාම් වර්ග





## නාන කාමරය

- මුඛ සේදුම් කාරක, කේශාලේපණ - ඩයි වර්ග, ෂැම්පු හා කන්ඩිෂනර් වර්ග




- පිරිසිදුකාරක
(ගෙබිම, ජනෙල්, හා වැසිකිළි පිරිසිදුකාරක)



- සේදුම් කුඩු, පැල්ලම් ඉවත් කරන ද්‍රව්‍ය,



## මුළුතැන්ගෙය

- ගෙබිම හා පිඟන් පිරිසිදුකාරක, ගිනි පෙට්ටි, භූමිතෙල්, මී නාශක




## ගබඩා කාමරය

- පිරිසිදුකාරක
- පොලිෂ් වර්ග
(පිත්තල භාණ්ඩ, ගෘහ භාණ්ඩ හා ගෙබිම සඳහා භාවිතා කරන පොලිෂ් වර්ග)




- තීන්ත වර්ග,




- තීන්ත ඉවත් කරන ද්‍රව්‍ය
(තිනර් හා ටර්පන්ටයින්, භූමිතෙල්, පොහොර වර්ග, විදුලි සක බල්බ්, ගම් වර්ග)



- ගෘහාශ්‍රිත පළිබෝධනාශක
(කෘමිනාශක, මදුරු දඟර, මී නාශක, වල් පැළෑටි නාශක)



## ගරාජය

- වාහන සඳහා භාවිතා කරන ද්‍රව්‍ය
- පෙට්‍රල්,ඩීසල්, බැටරි ඇසිඩ්





## විෂ වීම් සිදු විය හැකි ක්‍රම

- පානය කිරීමෙන්
- සමෙහි හා ඇසෙහි ගැටීමෙන්
- ආශ්වාසයෙන්

## විෂ ද්‍රව්‍ය ශරීරගත වීමෙන් ඇති විය හැකි රෝග ලක්ෂණ

- ඔක්කාරය, වමනය හා බඩරිදීම
- තොල් හා මුඛය අවට පිළිස්සීම
- හුස්ම ගැනීමේ අපහසුතා
- සමෙහි දැවිල්ල
- ඇස් රතුවීම, කඳුළු ගැලීම හා ඇස් දැවිල්ල
- හිසරදය, වලිප්පුව, සිහිමඳ ගතිය හා සිහි නැති වීම

## විෂ ද්‍රව්‍ය ශරීරගත වීමෙන් ඇති විය හැකි රෝග ලක්ෂණ

- භාවිතයට නොගන්නා අවස්ථාවලදී මෙම ද්‍රව්‍ය අඩංගු ඇසුරුම් හෝ භාජන වසා තබන්න. හොඳින් වැසී ඇත්දැයි තහවුරු කර ගන්න.
- මෙම ද්‍රව්‍ය කුඩා දරුවන්ට ළඟා විය නොහැකි ස්ථානයක අගුළු දා තබන්න.
- විෂ ද්‍රව්‍ය ගිනි ගන්නා සුළු ප්‍රභවයන්ගෙන් ඈත්ව ගබඩා කරන්න.
- පළිබෝධනාශක හෝ රසායන ද්‍රව්‍ය ඇසුරු භාජන ආහාර වර්ග ගබඩා කිරීම සඳහා භාවිතයට නොගන්න.
- රසායනික ද්‍රව්‍ය පළිබෝධනාශක තෙල් වර්ග, ඖෂධ මුළුතැන්ගෙයිහි ආහාර සමඟ ගබඩා නොකරන්න.